www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 6 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 6

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### පැබ්ලෝවාදී සංශෝධනවාදයේ මූලාරම්භය

110. පශ්චාත් යුද්ධ සමාජ අරගලයන්හි ප්‍රතිවිරෝධී ස්වභාවය, හැම අතකින්ම යලි තහවුරු වූ ධනේශ්වර සංවර්ධනය වෙතින් නයට ලැබුනු දෙයකි. යුද්ධයේ අවසානයත් සමඟ දියුනු රටවල පන්ති අරගලවල මෙන්ම යටත් විජිතවල අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයන්ගේ ද පිබිදීමක් ඇතිවිය. කෙසේ වුව ද මෙම අරගලයන්හි මුදුන අරක්ගත් ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාර, ස්ටැලින්වාදීන්, වෘත්තීය සමිති නිලධරය හා විවිධාකාර සුලු ධනපති ප්‍රවනතාවන් ක්‍රියාකාරී වූ ක්ෂේත්‍රය, ආර්ථික ස්ථාවරත්වය නිසා බෙහෙවින් පුලුල් විය. මෙම ව්‍යාපාර හා සංවිධානවල වෛෂයික ක්‍රියාකාරිත්වය මගින් එක් හෝ තවත් ආකාරයකින් ගෝලීය ධනේශ්වර පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා කම්කරු පන්තියේ හා පීඩිත ජනතාවගේ පුලුල් කොටස් අතර සහයෝගිතා පදනමක් සම්පාදනය කලේ ය. ඔවුහු යුද්ධයෙන් පසු ජීවිතයට නව හුස්මක් ලබා දුන් ජාතික ප්‍රතිසංස්කරනයේ ප්‍රතිපත්තීන් මගින් ස්ථිරසාර ජයග්‍රහන අත් කර ගත හැකිය යන මිත්‍යාව දිරිමත් කලහ.

111. පශ්චාත් යුද්ධ අවධියේ සංකීර්නතාවන්, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල ධනේශ්වර හා සුලු ධනේශ්වර සංවිධානවලට අනුගත වූ සංශෝධනවාදී ප්‍රවනතාවයක රූපයෙන් ප්‍රකාශයට පත්විය. ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවනතාවන් මෙන්ම සුලු ධනපති ජාතිකවාදී හා රැඩිකල් ව්‍යාපාර, සංශෝධනවාදීන්ට පෙනී ගියේ කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීමේ බාධකයන් ලෙස නොව සමාජවාදය සාක්ෂාත් කර ගැනීමේ විකල්ප උපකරන ලෙස ය. එබැවින් ප්‍රශ්නය වන්නේ හතර වන ජාත්‍යන්තරයේ ස්වාධීන ඉදිරිදර්ශනය මත මෙම සංවිධානවලට විරුද්ධවීම නොව කම්කරු පන්තිය හා ජාතිකවාදී ව්‍යාපාරවල පවත්නා නායකත්වයන්ට බලපෑම් දැමීමේ කන්ඩායමක් බවට හතර වන ජාත්‍යන්තරය ම පත් කර ගැනීමයි. සංශෝධනවාදීන්, ස්ටැලින්වාදීන් හා ධනේශ්වර ජාතිකවාදීන් වෙත ඓතිහාසිකව ප්‍රගතිශීලී ක්‍රියා කලාපයක් පවරනු ලැබූ අතර, ඔවුන්ගේ ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය පිලිබඳ ට්‍රොට්ස්කිගේ අවධාරනය නොතකා හලහ. හතර වන ජාත්‍යන්තරය ගොඩනැඟීමේ දී පදනම් කර ගත් මෙම ඉදිරිදර්ශනය පිලිබඳව සිදු කල සංශෝධනය පලමු වරට ඉදිරිපත් කලේ යුරෝපය තුල පශ්චාත් යුද්ධ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ප්‍රමුඛයන් දෙදෙනෙකු වූ මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩල් විසිනි.

112. පැබ්ලෝගේ සංශෝධනයන් වර්ධනය කලේ නැගෙනහිර යුරෝපයේ දේශපාලන වර්ධනයන් කෙරෙහි දැක්වූ ධාරනාවාදී ප්‍රතිචාරයක් ලෙසය. ස්ටැලින්වාදීන් අධිකාරය දැරූ තන්ත්‍රයන් ගොඩනැඟීම කෙරෙහි හතර වන ජාත්‍යන්තරයේ ප්‍රාරම්භක ප්‍රතිචාරය පදනම් වූයේ ට්‍රොට්ස්කිගේ සංකල්පයන් මතය. ස්ටැලින්වාදීන්ගේ දේශපාලන "ජයග්‍රහන" තිබිය දී ම හතර වන ජාත්‍යන්තරය අවශ්‍යයෙන්ම ඔවුන් හිමිකරගත් ප්‍රතිවිප්ලවවාදී ක්‍රියා කලාපය අවධාරනය කලේ ය. එය 1946 ප්‍රකාශ කලේ:

> ජනතා නැඟිටීම් පාගා දැමීම, ප්‍රතිවිප්ලවවාදී භීෂනය, කොල්ලකෑම් හා පැහැරගැනීම්, යන ඔවුන්ගේ කිව නොහැකි තරමේ ද්‍රෝහිත්වය, කොමියුනිස්ට්වාදය යන වචනය ද, එම අදහසම ද නිර්ධනීන්ගේ ඇස් පනාපිට අපකීර්තියට ලක් කලේය. කම්කරු පන්තියට එරෙහි ස්ටැලින්ගේ අපරාධවල පරිමාව සමහන් කිරීම සඳහා නැගෙනහිර යුරෝපීය ජනසතු කිරීම් කොතරම් නම් බරක් දරයිද? නැගෙනහිර යුරෝපය තුල ස්ටැලින්වාදයේ ප්‍රතිවිප්ලවවාදී මදාවිකම් ඔවුන්ට ඉතිහාසයේ ප්‍රගතිශීලී දූත මෙහෙවරක කීර්ති කදම්භය හිමිකර දෙනවාට වඩා, මෙම

ලේ නාගත් භූතයා ලෝක කම්කරු පන්තියට හා විමුක්තිය සඳහා වූ එහි අරගලයට දැනට මත් කර ඇති හානියට වැඩි යමක් කිරීමෙන් වලක්වා ලීම සඳහා ඔහු තලාදැමීමේ හදිසි අවශ්‍යතාව මතුකරයි.

ස්ටැලින්වාදයේ අන්ධභාවය, එහි කිව නොහැකි තරමේ ප්‍රතිගාමී ස්වභාවය මෙන්ම ඓතිහාසික බංකොලොත් භාවය, සියල්ලට මත් වඩා නැඟෙනහිර යුරෝපය තුල දී දැවෙන ආකාරයකින් හෙලිදරව් වුනා පමනි. නිලධරිවාදී කොල්ලයටත්, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ (සෝසසසං) ආර්ථික අවශ්‍යතාවන් විසඳීමේ ලා මුලුමනින්ම නිරර්ථක වූ සීමිත ප්‍රතිසංස්කරනයන්ටත් පින්සිඳු වන්නට ක්‍රෙම්ලිනය, නැඟෙනහිර යුරෝපයේ ද ලෝකය පුරා ද වෛරයේ තාප්පයක් ලෙස තෙමේ ම නැඟී ගත්තේය. දුඟී භාවයෙන් මිරිකී ගිය, බංකොලොත් බෝල්කන් ප්‍රදේශවල මිලිටරි පාලනයට පින් සිඳුවන්නට ක්‍රෙම්ලිනය, විප්ලවය තලාදමා ජරපත් ධනවාදය නඟාසිටුවීමට ඇංග්ලෝ - ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ට ඉඩ සැලසීය.[69]

113. 1949 අප්‍රේල් මාසයේ දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර විධායක කමිටුව (අයිඊසී) මෙසේ ලිවීය.

අ. ස්ටැලින්වාදය පිලිබඳ තක්සේරුවක්, එහි පිලිවෙතෙහි ප්‍රදේශගත ප්‍රතිඵල මත පිහිටා කල නො හැකි වන අතර, එවැන්නක් ආරම්භ කල යුත්තේ ස්ටැලින්වාදයේ ක්‍රියාකාරිත්වයේ ලෝක පරිමාන සමස්තයෙනි. ධනේශ්වර ක්‍රමයෙන්, අද පවා, එනම් යුද්ධය නිම වීමෙන් සිව් වසරකට පසුව පවා, ප්‍රකාශයට පත් කරන ජරාජීර්න තත්වය සේම 1943-45 පැවති සංයුක්ත තත්වය ද සැලකිල්ලට ගත් කල්හි, යුරෝපයේත් ආසියාවේත් ධනේශ්වර ක්‍රමය ක්ෂනික හා සමාන්තර කඩා වැටීමකට පාත්‍ර වීම වලක්වාලීමෙහි ලා තීරනාත්මක සාධකය ලෙස ලෝක පරිමානව පැවතියේ ස්ටැලින්වාදය බවට සැකයක් පැවතිය නොහැකිය. මෙම අර්ථයෙන් සලකා බලන කල්හි, නිලධරය විසින් බෆර් කලාපයෙහි අත් පත් කර ගැනුනු 'ජයග්‍රහන' වැඩි වූවොත් සමන්විත වනුයේ ලෝක රංග පථයෙහි සැටැලින්වාදය තමන්ට කල සේවාවාන් වෙනුවෙන්, අධිරාජ්‍යවාදය ගෙවූ මිලෙන්ය. එපමනක් නොව, මෙම මිල පවා අනතුරුව එලඹුනු අදියරෙහි නිරතුරුව ම ප්‍රශ්නයට භාජන විය.

ආ. ලෝක දෘෂ්ටියෙන් සලකා බලන කල්හි, සෝවියට් නිලධරය, බෆර් කලාපය සෝසසසංට උකහා ගැනීමේ අරුතින් තමන් සාක්ෂාත් කර ගත් ප්‍රතිසංස්කරනත්, එකී නිලධරය ම බෆර් කලාපය තුල තම කටයුතු මගින් ලෝක නිර්ධන පන්තියේ විඥානයට එල්ල කල ප්‍රහාරයනුත් තුලනාත්මකව සසඳ බලන කල්හි, පෙර කී ප්‍රතිසංස්කරන නොතැකිය යුතු වන තරමට ම බරින් අඩු වෙයි. සෝවියට් නිලධරය, විශේෂයෙන්ම බෆර් කලාපය තුල තම කටයුතු හා මුලුමහත් දේශපාලනය ම මගින්, ලෝක නිර්ධන පන්තිය අධෛර්යමත් කොට, මංමුලා කොට, හිරි වට්ටවා, එමගින්, යුද සූදානමක් පිලිබඳ අධිරාජ්‍යවාදී උද්ඝෝෂනයන්ට කිසියම් පරිමානයකින් වුව එය ගොදුරු වන තත්වයන්ට ද පත් කරවීය. සෝසසසං දෘෂ්ටියෙන් ම වුව බලන කල්හි බෆර් කලාපය තහවුරු වීමෙන් වන බල සම්පන්න වීම හා නොසැසඳිය හැකි තරම් වන බරපතල අනතුරක් ස්ටැලින්වාදය විසින් ලෝක නිර්ධන පන්තිය මතට පාත් කෙරුනු පරාජයන්හි හා දිරිය බල සිඳීමෙහි ගැබ් වෙයි. [70]

පැබ්ලෝ විසින් ට්‍රොට්ස්කිවාදය ප්‍රතික්ෂේප කිරීම

114. 1949 වසර දිග හැරෙත්ම, පැබ්ලෝ සිය ආස්ථානය වෙනස් කරමින් සිටින බවට සලකුනු දක්නට ලැබුනි. ධනවාදයේ සිට සමාජවාදය කරා සංක්‍රමනය සිදුවන්නේ ස්ටැලින්වාදී ආකෘතිය ඔස්සේ "සියවස් ගනනක විකෘති කම්කරු රාජ්‍යයන්" හරහා යයි ඔහු ලිවීමට පටන් ගත්තේය. 1951 දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර විධායක කමිටුව "යුද්ධ - විප්ලව" න්‍යායට සහාය පලකරන යෝජනාවක් සම්මත කලේය. මෙම න්‍යායට අනුව එක්සත් ජනපදය හා සෝවියට් සංගමය අතර හටගන්නා යුද්ධය ගෝලීය සිවිල් යුද්ධයක රූපය ගනු ඇති බවද, එහිදී සෝවියට් නිලධරයට සමාජ විප්ලවයන්ගේ විත්නඹුකම කිරීමට බලකෙරෙන බවට ද සංකල්පනය කෙරුනි. එම වසරේදී ම පැබ්ලෝ මෙසේ තර්ක කරන ලියවිල්ලක් ප්‍රකාශයට පත්කලේය. "අපගේ ව්‍යාපාරයට, වෛෂයික සමාජ යථාර්ථයෙහි හරය වනුයේ ධනේශ්වර පාලනය හා ස්ටැලින්වාදී ලෝකය යි." [71]

115. පැබ්ලෝගේ විශ්ලේෂනය පන්ති අරගලය කටුගා දැමීය. එනම්, කම්කරු පන්තියේ ස්වාධීන අවශ්‍යතාවන් හා එබැවින් හතරවන ජාත්‍යන්තරයේ ඓතිහාසික අවශ්‍යතාවයි. ඔහුට අනුව හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යය වනාහි පවත්නා ස්ටැලින්වාදී සංවිධාන තුල බලපෑම් දැමීමේ කන්ඩායමක් ලෙස කටයුතු කිරීමයි. පැබ්ලෝවාදය, ස්ටැලින්වාදී නිලධරය වෙනුවෙන් ගොඩනගන ලද

ව්‍යාජ අභ්‍යර්තනයන්, අර්ධ යටත් විජිත හා ඌන සංවර්ධිත රටවල ධනපති ජාතිකවාදී ව්‍යාපාර ද ඇතුලත් කරගත හැකි පරිදි තවත් පුලුල් කලේය. පන්ති විශ්ලේෂනයකට හිලව් වශයෙන් පැබ්ලෝ, "සැබෑ ජනතා ව්‍යාපරය තුලට ඒකාග්‍රවීම" ගැන කථා කලේය. 1951 අගෝස්තු - සැප්තැම්බරයේ දී පවත්වන ලද හජා තෙවන ලෝක සමුලුවට ඉදිරිපත්කල වාර්තාවක් තුල ඔහු මෙයින් උපුටාගත් <u>නිගමන</u> ප්‍රකාශයට පත් කලේය. "සෑම රටක ම මහජන ව්‍යාපාරය ප්‍රාදුර්භූතවන කොතැන්හි හෝ එය තුලට යථා වශයෙන් ඒකාග්‍රවීම හෝ එයට බලපෑම් කලහැකි වැදගත් ප්‍රවාහයක් ලෙස ඒකාග්‍රවීම සඳහා බැරෑරුම්ව, ප්‍රගාඪව හා සංයුක්තව සියලු සංවිධානාත්මක ගනන් බැලීම්, විධිමත් ස්වාධීනත්වය හෝ වෙනත් වූ සියල්ල, කැපකිරීමේ අවශ්‍යතාවය අවබෝධකර නොගත් එකදු ට්‍රොට්ස්කිවාදී සංවිධානයක් වත් දැනට ඇත්තේ නැත.[72]

116. පැබ්ලෝවාදයේ න්‍යායික පදනම වෛෂයිකවාදී විධික්‍රමයකි. එය ලෝක විප්ලවයේ සංවර්ධනය තුල පක්ෂයේ ක්‍රියාකලාපය පිලිබඳව මාක්ස්වාදී ව්‍යාපාරයේ අවධාරනය නොතකා හරියි. එය පසුව පැහැදිලි කෙරේ.

> වෛෂයිකවාදයේ ආස්ථානය, විප්ලවීය ප්‍රායෝගික භාවිතයට වඩා සමපේක්ෂනය යි; අරගලයට වඩා නිරීක්ෂනය යි. කල යුතු දේ විස්තර කරනවාට වඩා එය සිදුවන දේ යුක්ති සහගත කරයි. බලය අල්ලා ගෙන ඉතිහාසයේ ගමන් මග වෙනස් කිරීමට අදිටන් කර ගත් පක්ෂයක <u>ප්‍රායෝගික</u> භාවිතයට මග පෙන්වන න්‍යායක් ලෙස තවදුරටත් ට්‍රොට්ස්කිවාදය දකිනු වෙනුවට, හතරවන ජාත්‍යන්තරයට හතුරු නිර්ධන පන්තික නොවන බලවේගවල නායකත්වය යටතේ අවසන් වශයෙන් සමාජවාදය සාක්ෂාත් කර ගැනෙන ඓතිහාසික ප්‍රවර්තනයක් පිලිබඳ ව සාමාන්‍ය නිර්වචනය කිරීමක් ලෙස, ට්‍රොට්ස්කිවාදය දකිනු ලැබෙන, ඉදිරිදර්ශනයකට මෙම විධික්‍රමයෙන් න්‍යායික අධස්ථලය සම්පාදනය කෙරුනි. සිදුවීම් දාමයෙහි කිසියම් ඍජු කාර්යභාරයක් ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් ට්‍රොට්ස්කිවාදයට සම්මාන කල යුතු වී නම්, ඒ, හුදෙක් ස්ටැලින්වාදීන්ගේත් නව ස්ටැලින්වාදීන්ගේත් අර්ධ ස්ටැලින්වාදීන්ගේත් නිසැක ව ම ඊට අතිරේකව, ඒ හෝ මේ වර්ගයේ සුලුධනේශ්වර ජාතිකවාදීන්ගේත් කටයුතු අවිඥානකව හසරුවන කිසියම් ආකාරයක උපවිඥානගත මානසික සන්තතියක් හැටියට පමනි.
>
> පැබ්ලෝවාදය, මෙම අර්ථයෙන් ගත් කල්හි සාවද්‍ය තක්සේරු කිරීම්වලින්, ව්‍යාජ පෙරදැකීම්වලින්, ක්‍රියාමාර්ගික සංශෝධන පිලිබඳ පද්ධතියකින් බොහෝ ඔබ්බට ගියේ ය. එය විද්‍යාත්මක සමාජවාදයේ මුලු පදනමට ම පහර එල්ල කල අතර මුලු ශතවර්ෂයක් පුරා පන්ති අරගලයේ වර්ධනයෙන් මාක්ස්වාදීන් වියුක්ත කර ගත් ප්‍රධාන පාඩම් ද ප්‍රතික්ෂේප කලේ ය. නිර්ධන පන්ති අරගලයෙහි සවිඥානක අංගයේ අවශ්‍යතාවත්, නිර්ධන පන්ති ඒකාධිපතිත්වය ඓතිහාසික වශයෙන් සාක්ෂාත් කර ගැනුමත්, පැබ්ලෝ විසින් ප්‍රශ්නයට භාජන කෙරුනු කල්හි, විසි වන සියවසේ මාක්ස්වාදී න්‍යායේ විශිෂ්ඨතම ජයග්‍රහනය, එනම් පක්ෂය පිලිබඳ ලෙනින්වාදී සංකල්පය, පිරිහෙලනු ලැබීන. පැබ්ලෝට සහ ඔහුගේ අනුගාමිකයන්ට නිර්ධන පන්තියට න්‍යායික වශයෙන් අධ්‍යාපනය ලබා දීමට හෝ, එය තම ඓතිහාසික කර්තව්‍යයන් පිලිබඳව සවිඥානක කරවීමට හෝ අවශ්‍යතාවක් නොවී ය. නිර්ධන පන්තියේ ස්වාභාවික ව්‍යාපාරය මත ධනේශ්වර දෘෂ්ටිවාදයෙහි ආධිපත්‍යයට විරුද්ධව අරගලයක් කිරීම අවශ්‍ය නොවීය.
>
> ස්ටැලින්වාදයට අනුගත වීම නව පැබ්ලෝවාදී දෘෂ්ටියේ ප්‍රධාන ලක්ෂනය වෙතත්, එය එහි අත්‍යවශ්‍ය ලක්ෂනය ලෙස දැකීම වරදක් වනු ඇත. එදත් (අදත්) පැබ්ලෝවාදය මුල සිට අග දක්වා ම දිය කර හැරීම් වාදයකි. එනම් සමාජවාදී විප්ලවය තුල නිර්ධන පන්තියේ ආධිපත්‍යය සහ නිර්ධන පන්තියේ ඓතිහාසික කාර්යභාරයේ සවිඥානක ප්‍රකාශනය හැටියට හතරවන ජාත්‍යන්තරයේ සැබැවින් ම ස්වාධීන පැවැත්ම ප්‍රතික්ෂේප කිරීමකි.
>
> ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ <u>ප්‍රායෝගික</u> භාවිතය ප්‍රධාන වශයෙන් යොමු කෙරුනේ, නිර්ධන පන්තිය තම ඓතිහාසික කර්තව්‍යයන් කෙරෙහි සවිඥානක කරමින් සෙසු සියලු පන්ති බලවේගයන් කෙරෙන් එහි කොන්දේසි විරහිත ක්‍රියාමාර්ගික හා සංවිධානාත්මක ස්වාධීනත්වය තහවුරු කිරීම දිශාවට නොවේ. නිර්ධන පන්තියේ අසාමාන්‍ය විප්ලවීය කාර්යභාරය කෙරෙහි ඓතිහාසික ව පදනම් කෙරුනු විශ්වාසයක් මත පිහිටවනු ලැබුනු, පන්ති බලවේගයන් හා නිෂ්පාදනයේ සමාජ සම්බන්ධතා පිලිබඳව විද්‍යාත්මක වූ විශ්ලේෂනයක් මත ද, මෙම භාවිතය පදනම් කරනු නොලැබුනි. ඒ වෙනුවට දශක ගනනාවක අරගලයක් මගින් තහවුරු කෙරුනු මූලධර්මාත්මක ආස්ථානයන්, පවතින ස්ටැලින්වාදී, සමාජ ප්‍රජාතාන්ත්‍රික, සහ

ධනේශ්වර ජාතිකවාදී සංවිධානවල නායකයන්ට බලපෑම් දැමීමේත්, ඔවුන් වමට තල්ලු කිරීමේ ත් නිෂ්ඵල අපේක්ෂාව වෙනුවෙන් අත්හැර දැමීමෙහි, උපායාත්මක සොච්චමකට, කටයුතු බාල්දු කරනු ලැබුනි.[73]

117. මෙම ඉදිරිදර්ශනය මත මැන්ඩල්ගේ ද උදව් ඇතිව ක්‍රියාත්මක වෙමින් පැබ්ලෝ, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර ලේකම් වශයෙන් සිය තත්වය ගසාකෑමට උත්සාහ කලේ සියලු ජාතික ශාඛාවන්ම ස්වාධීන සංවිධානයන් ලෙස සිය පැවැත්ම අහෝසිකර ගනිමින්, ස්ටැලින්වාදී පක්ෂවල පසු පෙලට ඇතුල්වීමට බලකිරීම සඳහාය. මේ උපාය ඔවුන් හැඳින්වූයේ එන්ට්‍රිසම් සූ ජෙනරිස් යනුවෙනි. සෑම රටකම හතරවන ජාත්‍යන්තරයේ ශාඛාවන් ගොඩනැඟීම මත අවධාරනය යෙදීම වරදක් යයි සංශෝධනවාදීහු නිගමනය කලහ. මෙය බොහෝ වතාවක් පුනර්කරනය කල ව්‍යසනකාරී ඉදිරිදර්ශනයක අංගලක්ෂනයක් වී තිබේ. අද දින ගනන් නැති අවස්ථාවාදී ප්‍රවනතාවන් අතර ද මෙය දක්නට ඇත. විප්ලවවාදී පක්ෂ ගොඩනැඟීම කල නොහැකි දෙයක් බැවින් ඔවුන් නිගමනය කලේ, දී ඇති ඕනෑම මොහොතක මහජන සංවිධානවලට නායකත්වය සපයන යම් වෙනත් බලවේග දෙස, ඒවායේ ඉතිහාසය, ක්‍රියාමාර්ගය හා පන්ති පදනම නොතකා, යමෙකු හැරී බැලිය යුතුය බවය.

118. එක්සත් ජනපදය තුල පැබ්ලෝවාදී ප්‍රවනතාවට නායකත්වය දුන්නේ බර්ට් කොක්රාන් විසිනි. එය සිය සහයෝගය ලබාගත්තේ ප්‍රධානකොටම කම්කරු පන්තිය මත ප්‍රති කොමියුනිස්ට්වාදී පීඩනය පිලිබිඹුකල එස්ඩබ්ලිව්පීයේ වෘත්තීය සමිතිවාදී කොටස් අතරින් හා සිය ජීවන තත්වයේ ඉහල නැඟීමෙන් වාසි ලැබූ වඩාත් සංස්ථිතික කම්කරු ස්ථරයන්ගේ වර්ධනයෙන් ය. ට්‍රොට්ස්කිවාදය හා ස්ටැලින්වාදය අතර භේදය පිලිබඳ කුමන හෝ සාකච්ඡාවක් අතහැර දැමීමට කොක්රාන්වාදීන්ට අවශ්‍ය විය. එම ආස්ථානය ප්‍රකාශිත වූයේ ඔවුන්ගේ කුප්‍රකට සටන් පාඨය වූ "පැරනි ට්‍රොට්ස්කිවාදීන් කුනුගොඩට දමනු" යන්නෙනි. සමාජවාදී විඥානය යනු ඓතිහාසික විඥානයයි යන ප්‍රධාන මූලධර්මයට විරුද්ධවෙමින් 1951 දී කොක්රාන් මෙසේ ලිවීය. "සමීපතම හා වඩාත් සෘජු අර්ථයෙන් ගත්කල, ට්‍රොට්ස්කි අපගේ ව්‍යාපාරයෙහි ගුරුවරයා ද, නායකයා ද වන අතර ම මෙම ප්‍රස්තුතයන් දෙක අනුව යමින් ස්ටැලින් - ට්‍රොට්ස්කි සටනේ හරි හා වැරදි මත කම්කරුවන් සවිමත් කිරීමට උත්සාහ දැරීම මගින් අපගේ ධජය වටා ඔවුන් ඒකරාශී කිරීම වැඩි සාර්ථකත්වයක් අත්කර ගනිතැයි කිසිසේත්ම අදහස් නොකරයි. ඒවා දැන් ඉතිහාසය තුලට පසුබැස තිබේ."[74] ඉතිහාසය අතහැර දැමීම සඳහා කෙරෙන මෙම කැඳවුම සැබවින්ම නම් එම ඉතිහාසය නියෝජනය කරන ඉදිරිදර්ශනය හා මූලධර්ම ප්‍රතික්ෂේප කිරීමය. කොක්රාන් වරුන්ගෙන් බොහෝ දෙනෙක් අවසානයේදී සිය දියකර හැරීමේ ඉදිරිදර්ශනය එහි තර්කාන්විත අවසානය කරා ගෙනයමින් වෘත්තිය සමිති නිලධරය හා ඩිමොක්‍රටික් පක්ෂය වෙත ලඟා වූහ.

## විවෘත ලිපිය හා ජාත්‍යන්තර කමිටුව ගොඩනැඟීම

119. හතරවන ජාත්‍යන්තරය තුල වර්ධනය වූ කටුක කන්ඩායමික අරගලය 1953 දී කුලුගැන්වුනේ කැනන් විසින් ලියන ලද විවෘත ලිපියක් ලොව පුරා ට්‍රොට්ස්කිවාදීන් වෙත නිකුත් කිරීමත් සමඟය. මෙම ලිපිය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැඟීම සඳහා ක්‍රියාමාර්ගික පදනම සකස් කලේය. කැනන් මෙම ලිපිය නිකුත් කලේ, හතරවන ජාත්‍යන්තරයේ නායකත්වය තුල සිය තනතුරු උපයෝගීකර ගනිමින් පැබ්ලෝ හා මැන්ඩල්, ව්‍යාපාරය කඩාකප්පල් කර බිඳ දමන කොන්දේසි යටතේය. බ්‍රිතාන්‍යයේ හා ප්‍රන්සයේ ට්‍රොට්ස්කිවාදී සංවිධාන විසින් දෙන ලද සහයෝගය හමුවේ කැනන්ගේ ක්‍රියාව, ලෝක ව්‍යාපාරය පොරබැදූ අවස්ථාවන් මඟින් මුලුනින්ම යුක්ති යුක්ත කලේය. පරදුවට තැබුනේ හතරවන ජාත්‍යන්තරය ගොඩනැඟීමේදී පදනම් කර ගත් අත්‍යාවශ්‍ය දේශපාලන මූලධර්මයන් ආරක්ෂා කිරීමයි. එමෙන්ම ස්වාධීන විප්ලවවාදී සංවිධානයක් ලෙස එහි පැවැත්මය. පැබ්ලෝවාදය සමඟ සම්මුතියක් තිබිය නොහැක්කේ මන්දැයි පැහැදිලි කල කැනන්ගේ ලිපිය තුල මෙම මූලධර්ම සාරාංශ ගත කර තිබේ.

1. ධනේශ්වර ක්‍රමයේ මර ලතෝනිය, එන්ට එන්ට ම දරුනු වන අවපාත, ලෝක යුද්ධ හා ෆැසිස්ට්වාදය බඳු ම්ලේච්ඡ ප්‍රපංච මගින් ශිෂ්ටාචාරය විනාශ වී යාමේ තර්ජනය ඉස්මතු කරයි. අද දින න්‍යෂ්ටික ආයුධවල වර්ධනය හැකි බැරෑරුම් ම ආකාරයට මෙම අනතුර අවධාරනය කරයි.

2. අගාධයට කිඳ බැසීම වැලැක්විය හැකි වනුයේ සමාජවාදයේ සැලසුම්ගත ආර්ථිකයෙන් ධනේශ්වර ක්‍රමය ලෝක පරිමානව විස්ථාපනය කිරීමෙන් හා ධනේශ්වර ක්‍රමය විසින් එහි මුල් දිනවල ආරම්භ කෙරුනු ප්‍රගතියේ සර්පිලාකාර ගමන යලි පටන් ගැනීමෙනි.

3. සමාජයෙහි මෙය සාක්ෂාත් කර ගත හැකි වනුයේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ පමනි. කම්කරුවන්ට බලයේ මාවත ගැනුම සඳහා, අද තරම්, අන් කිසි දාක සමාජ බලවේගවල ලෝක සම්බන්ධතාව යහපත්

නොවූවත්, කම්කරු පන්තියම නායකත්වය පිලිබඳ අර්බුදයකට මුහුන දෙයි.

4. මෙම ලෝක ඓතිහාසික අරමුන සපුරා ගනු වස් තමන් සංවිධානය වනු පිනිස, සෑම රටකම කම්කරු පන්තිය, ලෙනින් විසින් වර්ධනය කෙරුනු ආකාරයේ විප්ලවීය සමාජවාදී පක්ෂයක් ගොඩනැංවිය යුතු යඃ එනම්, ප්‍රජාතන්ත්‍රවාදය හා මධ්‍යගතභාවය අපෝහකාත්මකව සංයෝජනය කිරීමෙහි සමත් වන සටන් පක්ෂයකි - තීන්දුවලට එලඹීමෙහි ප්‍රජාතන්ත්‍රවාදයත්, ඒවා ක්‍රියාත්මක කිරීමෙහි මධ්‍යගත භාවයත් අනුගාමිකත්වය විසින් පරිපාලනය කෙරෙන නායකත්වයක්, වෙඩිසැර හමුවෙහි ද විනය ගත ආකාරයට පෙරට යාමෙහි සමත් අනුගාමිකත්වයක්.

5. මෙයට පවත්නා ප්‍රධාන බාධකය ස්ටැලින්වාදය යි. රුසියාවේ 1917 ඔක්තෝබර් විප්ලවයෙහි හොඳ නම ගසා කමින් එය කම්කරුවන් ආකර්ෂනය කර ගන්නේ, හුදෙක් පසුව, කම්කරුවන්ගේ විශ්වාසය පාවාදෙමින් ඔවුන් එක්කෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ තුරුල්ලට, උදාසීනත්වයට ඇද දැමීමට හෝ ආපසු ධනේශ්වර ක්‍රමය පිලිබඳව ම මිථ්‍යාවන්ට ඇද හෙලීමට ය. ෆැසිස්ට් හෝ රාජාන්ඩුවාදී බලවේගයන්හි තහවුරු වීමේ රූපාකාරයෙන් හා ධනේශ්වර ක්‍රමය විසින් පෝෂනය කොට සූදානම් කෙරෙන අලුත් යුද පිපිරුම්වල රූපාකාරයෙන් කම්කරු පන්තිය මෙම පාවාදීම්වල වන්දිය ගෙවයි. හතරවන ජාත්‍යන්තරය එය පිලි සිඳගත් තැන් පටන් ම තමන්ගේ ප්‍රධාන කර්තව්‍යයන්ගෙන් එකක් බවට පත් කර ගත්තේ, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුලත් ඉන් බැහැරත් ස්ටැලින්වාදය විප්ලවීය අයුරින් පෙරලා දැමීම යි.

6. හතරවන ජාත්‍යන්තරයේ බොහෝ කන්ඩායම් ද, එහි ක්‍රියා මාර්ගයට හිත පක්ෂපාතී පක්ෂ හෝ කන්ඩායම් ද, හමුවෙහි නම්‍ය උපායන් සඳහා පවතින අවශ්‍යතාව විසින්, ස්ටැලින්වාදයට යටත් නොවී, අධිරාජ්‍යවාදයටත් ජාතිකවාදී සංයුතීන් හෝ වෘත්තීය සමිති නිලධරයන් බඳු එහි සියලුම සුලු ධනපති ආයතනවලටත්, අනෙක් අතට අධිරාජ්‍යවාදයට යටත් නොවී ස්ටැලින්වාදයටත් විරුද්ධව සටන් කල යුත්තේ කෙසේදැයි ඔවුන් විසින් දැන ගනු ලැබීම අනිවාර්යතාවක් බවට පත් වේ. අවසාන විග්‍රහයේදී ස්ටැලින්වාදය වනාහී අධිරාජ්‍යවාදයේ ම සුලු ධනපති ආයතනයක් වෙයි. [75]

120. මෙම සියලු මූලධර්ම පැබ්ලෝ විසින් ප්‍රතික්ෂේපකර ඇති බව විවෘත ලිපියෙන් පෙන්වාදෙන ලදී.

> නව ම්ලේච්ඡත්වයක අනතුර අවධාරනය කරනු වෙනුවට, ඔහු, සමාජවාදය දිශාවට ඇති තල්ලුව 'ආපසු නොහැරවිය හැකි වූවක් සේ' දකී; එසේ වුවත් ඔහු, අපගේ පරම්පරාවෙහි දී හෝ එලඹෙන පරම්පරා කිහිපයකදී හෝ සමාජවාදය සම්ප්‍රාප්ත වන බවක් ද නොදකී. ඒ වෙනුවට, ඔහු 'විකෘත' එනම් 'ශතවර්ෂ ගනනාවක්' පවතින ස්ටැලින් වර්ගයේ කම්කරු රාජ්‍යවලට විනා, අනෙකකට සම්භවය නො සපයන 'ගලා බස්නා' විප්ලව රැල්ලක් පිලිබඳ සංකල්පය ඉදිරිපත් කොට ඇත.
>
> මෙය කම්කරු පන්තියේ ශක්තීන් පිලිබඳ පූර්න අසාර දර්ශනය අනාවරනය කරයි; එය ස්වාධීන විප්ලවීය සමාජවාදී පක්ෂ ගොඩනැංවීමේ අරගලය සම්බන්ධයෙන්, ඔහු මෑත දී කල සරදම් හා සපුරා ගැලපෙන්නේ ය. සියලුම උපායාත්මක ක්‍රම මගින් ස්වාධීන විප්ලවීය සමාජවාදී පක්ෂ ගොඩනැංවීමේ ප්‍රධාන මාවතට බැඳී සිටිනු වෙනුවට, ට්‍රොට්ස්කිවාදයේ 'අදහස්' හා 'ක්‍රියා මාර්ගය' පිලිගැනීමට හැකිවන පරිදි මහජන පීඩනය යටතේ ස්ටැලින්වාදී නිලධරය නැතහොත් එහි තීරනාත්මක කොටසක් වෙනස්වනු ඇතැයි කියමින් ඔහු ඒ වෙත බලාපොරොත්තු රඳවයි. [76]

121. කැනන්ගේ ලිපිය අවසන් වන්නේ අනතුරු ඇඟවීමක් හා ක්‍රියාකාරී වීමට කැඳවුමක් ද සහිතවය.

> හකුලුවා දක්වතොත්ඃ පැබ්ලෝගේ සංශෝධනවාදය හා සාම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදය අතර බෙදුම් කඩනය කොතරම් ගැඹුරු දැයි කිව හොත්, දේශපාලනිකව හෝ සංවිධානාත්මකව හෝ කිසිදු සම්මුතියක් ඇති කර ගැනුමට පුලුවන් කමක් නැත. සැබැවින්ම බහුතර මතය පිලිබිඹු කරන ප්‍රජාතන්ත්‍රික තීන්දුවලට එලඹීමට අවසර නොදෙන බව පැබ්ලෝ කන්ඩායම පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ සාපරාධී පිලිවෙත් වලට පූර්න යටත්වීමක් ඔවුහු ඉල්ලා සිටියත් සියලුම සම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදීන් හතරවන ජාත්‍යන්තරයෙන් එලවා දැමීමට හෝ ඔවුන්ට

මුකවාඩම් බැඳීමට හා මාංචු දැමීමට ඔවුහු අදිටන් කර ගෙන සිටිත්. [77]

හතරවන ජාත්‍යන්තරයේ අනුගාමිකත්වයන්ගෙන් බැහැරව සිටීමට අපට බල කෙරී ඇති තත්වයක, එවන් බාහිර ආස්ථානයක සිටිමින් හතරවන ජාත්‍යන්තරයේ ශාඛාවලට උපදෙසක් දීමට අපට හැකි නම්, ක්‍රියා කිරීමට, තීරනාත්මකව ක්‍රියා කිරීමට, කාලය එලඹ ඇතැයි අප සිතන බව අපි පවසමු. පැබ්ලෝ විසින් අධිකාරය පැහැර ගනු ලැබීමට විරුද්ධව, හතර වන ජාත්‍යන්තරයේ සාම්ප්‍රදායික ට්‍රොට්ස්කිවාදී බහුතරයට තමන්ගේ අධිෂ්ඨානය තහවුරු කිරීමට කාලය එලඹ තිබේ. [78]

## පක්ෂය පිලිබඳ ලෙනින්-ට්‍රොට්ස්කි න්‍යාය

122. භේදයෙන් පසු කාලයේ කැනන්, ඉන් මතුකල අත්‍යාවශ්‍ය මූලධර්මාත්මක දේශපාලන ප්‍රශ්න විස්ථාරනය කලේය. ඔහු පැබ්ලෝ හා මැන්ඩල්ගේ ස්වයංසිද්ධ භාවයේ සංකල්පවලට මාක්ස්වාදයේ අශමනීය විරුද්ධත්වය අවධාරනය කලේය.

> සවිඥානක පෙරමුනු බලඇනියේ පක්ෂය පිලිබඳවත්, විප්ලවීය අරගලයේ නායකයා ලෙස එම පක්ෂයේ කාර්ය භාරය පිලිබඳවත් ලෙනින් ට්‍රොට්ස්කි න්‍යායට කොන්දේසි විරහිතව බැඳී ගත්තෝ අපි පමනක්ම වෙමු. වර්තමාන යුගයෙහි මෙම න්‍යාය දැවෙන යථාර්ථවත් භාවයක් අත් පත් කර ගන්නා අතර ම අන් සියල්ල කෙරෙහි ආධිපත්‍යය උසුලයි.
>
> නායකත්වය පිලිබඳ ගැටලුව, දැන්, දිග් ගැස්සුන සන්තතියක් තුල, පන්ති අරගලයෙහි ඉබේ පැන නගින ප්‍රකාශනයන්ට පමනක් ම සීමා නොවේ; ධනේශ්වර ක්‍රමය විශේෂයෙන් දුර්වල ඒ හෝ මේ රටෙහි බලය ග්‍රහනය කර ගැනුමට ද එය සීමා නොවේ. එය වනාහී ජාත්‍යන්තර විප්ලවයේ වර්ධනය හා සමාජය සමාජවාදී ලෙස පරිවර්තනය කිරීම පිලිබඳ ප්‍රශ්නයකි. මෙය ඉබේටම සිදුවිය හැකි යයි පිලිගැනීමේ අර්ථය නම් මාක්ස්වාදය මුලුමනින් ම අත් හැර දැමීමයි. නැත. එය, සවිඥානක කටයුත්තක් පමනක්ම විය හැකි හෙයින්, ඒ සඳහා ඓතිහාසික ප්‍රවර්තනයේ සවිඥානක අංශය නියෝජනය කරන මාක්ස්වාදී පක්ෂයේ නායකත්වය අනිවාර්යයයෙන් ම අවශ්‍ය වෙයි. ඒ සඳහා වෙන මොනම පක්ෂයක් වත් ප්‍රමානවත් නැත. කම්කරු ව්‍යාපාරය තුල වෙන මොනම ප්‍රවනතාවක් වත් සතුටුදායක ආදේශකයක් හැටියට සැලකිය නොහැකි ය. ඒ හේතුව නිසා අනෙක් සියලුම පක්ෂ හා ප්‍රවනතා කෙරෙහි අපගේ ආකල්පය සම්මුති විරහිත ව ම වෛරී වෙයි.
>
> බලවේගයන්ගේ සම්බන්ධතාව විසින් පෙරමුනු බලඇනියෙහි කේඩර, ඒ මෙහොතෙහි ස්ටැලින්වාදී, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, මාධ්‍යමික බඳු හතුරු ප්‍රවනතා ආධිපත්‍යය දරන්නා වූ සංවිධානවලට අනුගත කරවීමක් අවශ්‍ය කෙරෙන්නේ නම් සෑම කල්හිම එවැනි අනුගත කරවීමක් සැලකිය යුතු වනුයේ එම සංවිධානවලට විරුද්ධව අරගලය කරගෙන යාම පහසු කරවීම සඳහා උපායාත්මක අනුගතවීමක් හැටියට ය; කිසිම විටක ඔවුන් හා සමගි සන්ධාන ගතවීම සඳහා නොවේ; කිසිම විටක ප්‍රන්ස මහා වැඩ වර්ජනය සම්බන්ධයෙන් පැබ්ලෝවාදී අදහස් උදහස් දැක්වීම සිදු කෙරුනු ආකාරයෙන්, මිත්‍රශීලී උපදෙස් හා 'භක්තිමත්' විවේචන ඉදිරිපත් කිරීමේ කුඩා කටයුත්ත මාක්ස්වාදීන්ට පවරා ගෙන තීරනාත්මක ඓතිහාසික කාර්යභාරය පෙර කී අයට භාර දීම සඳහා නො වේ. [79]

## අර්බුදයට පත් ස්ටැලින්වාදය

123. හතරවන ජාත්‍යන්තරය තුල හා ඉන් පිටත සිදුවූ අරගලය පිලිබිඹු කලේ ලෝක තත්වයේ අපේක්ෂිත වෙනස්කම්ය. භේදය දිග හැරෙද්දීම ක්‍රෙම්ලින් තන්ත්‍රය අර්බුදයෙන් ඇලලී ගියේය. නැගෙනහිර යුරෝපයේ ලේ වැකි විරේක කිරීමේ නඩු විභාග හා සෝවියට් සංගමයේ යුදෙව් ජාතික වෛද්‍යවරුන් අත්අඩංගුවට ගැනීමේ අපකීර්තිමත් වැඩ කටයුතු එය ඕනෑවටත් වඩා පැහැදිලි කලේය. ස්ටැලින්ගේ අනුගාමිකත්වය අතර පවා ඒකාධිපතියාගේ බුර බුරා නැගෙන පීඩනෝන්මාදය වලක්වාලිය හැකි තර්කාන්විත ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක්, පශ්චාත් යුද්ධ සෝවියට් සමාජය තුල ගැඹුරුවන අර්බුදය කෙරෙහි පලවූයේ නැත. කෙසේ වෙතත් සැක කටයුතු වාතාවරනයක් යටතේ, 1953 මාර්තුවේ දී සිදුවූ ස්ටැලින්ගේ හදිසි මරනය ප්‍රතිපත්තිවල මාරුවකට අවස්ථාව උදා කලේය. දේශපාලන මන්ඩලයේ කෙටි කන්ඩායමික අරගලයකින් පසුව ස්ටැලින්ගේ රහස් පොලිසියේ ප්‍රධානී ලැව්රෙන්ටි බෙරියා බලයෙන් පහකර මරාදමනු ලැබිනි. මෙම ක්‍රියාවත් සමඟ, ස්ටැලින් විසින් බොල්ශෙවික් පක්ෂයේ විප්ලවවාදී කේඩරයන් විනාශ කිරීමට පින්සිදු වන්නට බලය හිමිකරගත් නිලධරය, නිතර ලඹදුන් විරේකයන්, අත්අඩංගුවට ගැනීම්, ඝාතනයන්ගේ තර්ජනය නොමැතිව සිය වරප්‍රසාද භුක්තිවිඳීමේ කැදරකම පෙන්නුම් කලේය. එහෙත් නිලධරයේ වරප්‍රසාද කොල්ලය සෝවියට් සංගමය තුලම හා නැගෙනහිර යුරෝපයේ කම්කරු පන්තියෙහි වැඩෙන නොසංසුන්තාවය හමුවේ විශාල අභියෝගයකට මුහුන පෑවේය. 1953 ජූනි මාසයේ නැගෙනහිර ජර්මනියේ කම්කරුවන් ස්ටැලින්වාදී නිලධරයට එරෙහිව නැඟීසිටි අතර සෝවියට්

හමුදාබලය යොදා මර්දනු ලැබින. 1956 පෙබරවාරියේ නිකිතා කෲෂෙව් කොමියුනිස්ට් පක්ෂයේ විසිවන සමුලුව අමතා සිය "රහස් කථාව" පැවැත්විය. එහිදී ඔහු ස්ටැලින්ගේ සමහර අපරාධ හෙලාදැක්කේය. එහෙත් හිතාමතාම ඔහුගේ අපරාධ ලැයිස්තුවෙන්, ට්‍රොට්ස්කිවාදී වාම විපාර්ශවයේ නායකයන් හා මොස්කව් නඩුවල දී මරා දමනු ලැබූවන් ඉවත් කර තිබුනි. ස්ටැලින්වාදී නිලධරයේ නායකයා ලෙස කෲෂෙව්ට ස්ටැලින්ගේ අපරාධයන්හි මූලාරම්භය පිලිබඳ විස්තරයක් කර ලාබෙට සමාවගත නොහැකිය. නිලධරය තුල හා සමස්ත සෝවියට් ජනතාව අතරම සිටි ස්ටැලින්ගේ හෙන්චයියන්, "පුද්ගල වන්දනාවේ නිකායක" දාසයන්ව සිටියහ. එම වසරේම හංගේරියානු කම්කරුවන් කැරලි ගැසූ අතර දේශපාලන විප්ලවයේ කලල රූපයක් වන් කම්කරු සභා ගොඩනැඟුහ. කෲෂෙව් බුඩාපෙස්ට් වෙත සෝවියට් යුදටැංකි පිටත්කර හරිමින්, නැගිටීම කුරිරු ලෙස මැඩ පැවැත්වීය. මෙම ක්‍රියාවෙන් යලිදු වතාවක් ප්‍රදර්ශනය කලේ තරයේ ම ප්‍රතිවිප්ලවවාදී ස්ටැලින්වාදයේ ස්වභාවයයි. කම්කරු පන්තියේ මොනම විප්ලවවාදී ව්‍යාපාරයක් කෙරෙහි හෝ දක්වන ස්ටැලින්වාදයේ ගොරතර විරුද්ධත්වය, ස්ටැලින්ගේ ම මරනයෙන් වුවත් වෙනස් නොවීය.

124. ස්ටැලින්වාදයේ අර්බුයෙන්, ප්‍රධාන දේශපාලන ප්‍රශ්න පැහැදිලි කිරීමට මහඟු අවස්ථාවක් උදාකලේය. ජෙරී හීලිගේ නායකත්වයෙන් බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීහු, ස්ටැලින්වාදයට එරෙහි ට්‍රොට්ස්කිගේ අරගලය යටින් පැවති දැවැන්ත දේශපාලන ප්‍රශ්න පැහැදිලි කිරීමේ වැදගත්කම අවධාරනය කලහ. ස්ටැලින්වාදයේ සෑම දේශපාලන උපාමාරුවක්ම ප්‍රගතිශීලී නිලධාරිමය "ස්වයං පුනරුත්ථාපනය" පිලිබඳ නිදසුනක් ලෙස හැඳින්වූ පැබ්ලෝවාදීන්ට එරෙහි අරගලය ගැඹුරු කිරීමේ අවශ්‍යතාවය මේ තුල ගැබ්විය. කෙසේවුවත් හරියටම මේ අවස්ථාවේ, 1953-54 කාලය තුල කැනන් විසින් එතරම් බලගතු ලෙස අවධාරනය කල පැබ්ලෝවාදයට එරෙහි මඟ නොහැරිය හැකි විරුද්ධත්වයෙන් පසුබැසීමක්, එස්ඩබ්ලිව්පී නායකත්වයෙන් ප්‍රකාශිත විය. පසුගිය වසරවල දී හජාජාක හා පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලය අතර වෙනස්කම් මැකීගොස් අතැයි යන ව්‍යාජ පසුබිම තුල, 1957 වනවිට, පැබ්ලෝවාදීන් සමඟ යලි එකමුතුවීමේ හැකියාව කෙරෙහි කැනන් සිය අවධානය යොමු කරමින් සිටියේය. පැබ්ලෝවාදය කෙරෙහි එස්ඩබ්ලිව්පී ආකල්පයේ මෙම මැරුව, එහි පොදු දේශපාලන පිලිවෙතෙහි නිශ්චිත දකුනු ගමනක් පිලිබිඹු කලේය. 1950 ගනන් අවසානයේ එස්ඩබ්ලිව්පීය, විවිධ රැඩිකල් ප්‍රනතාවන් සමඟ "යලි කාන්ඩගැසීමේ" සූදානම ඇඟවුම් කලේය. පැබ්ලෝවාදය කරා යලි සම්ප්‍රාප්තවීම එස්ඩබ්ලිව්පී හි පන්ති අක්ෂයෙහි වෙනසක් සලකුනු කලේය. ඒ, එහි සම්ප්‍රදායික "නිර්ධන පන්තික දිශානතියෙන්" ඉවතට හා සුලු ධනේශ්වරයේ රැඩිකල් කොටස්වල දේශපාලන නියෝජිතයන් සමඟ කල්ලිගැසීම දෙසටය.

## එස්ඩබ්ලිව්පීය පැබ්ලෝවාදය කරා යලි සේන්දු වීම හා කැස්ට්‍රෝවාදය

125. 1959 ජනවාරියේ කැස්ට්‍රෝ බලයට පත්වීම, එස්ඩබ්ලිව්පීය තුල වැඩෙමින් පැවති අවස්ථාවාදී කන්ඩායමට, ඇමරිකානු රැඩිකල්වාදයේ සුලු ධනපති පරිසරය දෙසට පක්ෂය යලි මුල් බැස්සවීමට වාහනයක් විය. කැස්ට්‍රෝ ආන්ඩුව බලයට පැමිනියේ ගොවි ජනතාව මත පදනම්වූ ගරිල්ලා යුද්ධයක් හරහා ධනේශ්වර ජාතිකවාදී ක්‍රියාමාර්ගයක් මුල්කරගෙනය. එම ව්‍යාපාරයේ ජාතිකවාදී ස්වභායත්, සමාජ ප්‍රතිසංස්කරන ක්‍රියාවට නැගීම සඳහා ආරම්භයේ දරන ලද උත්සාහයත් ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ එය ගැටුමකට ඇද දැමීය. එක්සත් ජනපද තර්ජන හමුවේ කැස්ට්‍රෝ සෝවියට් සංගමයේ සහයෝගය පැතීය. කැස්ට්‍රෝ තන්ත්‍රය, "තමන් කොමියුනිස්ට්වාදී" යයි ප්‍රකාශකලේ එම අවස්ථාවේදී ය.

126. එස්ඩබ්ලිව්පීය ආරම්භයේ දී කැස්ට්‍රෝ තන්ත්‍රය, ධනේශ්වර ජාතිකවාදී ලෙස හැඳින්වුව ද දැන් ජෝසෆ් හැන්සන්ගේ නායකත්වය යටතේ, 1960 ගනන්වල එහි පිලිවෙත වෙනස් කලේය. මෙම වෙනස හඳුන්වාදීමේ ප්‍රමුඛ ක්‍රියා කලාපය ඉටුකලේ "කියුබාව සඳහා සාධාරනය ඉටුකිරීමේ කමිටුව" සමග එස්ඩබ්ලිව්පීයේ වේගවත් හා දේශපාලනිකව පැහැදිලි නොකල සැක කටයුතු සම්බන්ධයයි. 1960 දෙසැම්බරයේ දී කියුබාව කම්කරු රාජ්‍යයක් බවට පත්ව ඇතැයි එස්ඩබ්ලිව්පීය ප්‍රකාශයට පත්කලේය. ජනසතු දේපල පිහිටුවීම යන කයෝර තත්කාර්යවාදී පදනමක සිට හැන්සන්, මෙම ආස්ථානය ආරක්ෂා කලේය. රුසියාවේ ගොවිජන ප්‍රශ්නය මුල්කරගෙන ලෙනින්, සිය වෙලුම් ගනනාවක ලියවිලි තුල නිරන්තරයෙන් සඳහන් කල පරිදි, ඉඩම් ජනසතුව සාරය වශයෙන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පියවරක් බව අමතකවී ඇති සෙයක් පෙනී ගියේය. තන්ත්‍රයේ පන්ති පදනම හා කම්කරු පන්තියේ බලය සඳහා පෙනී සිටි ස්වාධීන සංවිධානයක් නොමැතිකම ද ඇතුලු, කියුබානු විප්ලවයේ ඓතිහාසික හා න්‍යායික ගැටලු පිලිබඳ විශ්ලේශනයකට හැන්සන් යොමුවූයේ ද නැත. නැගෙනහිර යුරෝපය හා චීනය පිලිබඳ එස්ඩබ්ලිව්පීයේ සාකච්ඡාවන් හි මේ ප්‍රශ්න පැලපදියම්ව තිබුනි. තව ද, චීනයේ වර්ධනයන්ට සලකනු ලැබුවේ ජාත්‍යන්තර තත්වයෙන් හා ගෝලීය ඉදිරිදර්ශනයේ සියලු ප්‍රශ්නවලින් පරිබාහිරවය. කැස්ට්‍රෝ ජනසතු කිරීම් වෙත යොමුවීමේ "කාරනය" ම, "අවිඥානක මාක්ස්වාදීන්ගේ" නායකත්වය යටතේ "මොට්ටවූ ආයුධවලින්" විප්ලවය සාක්ෂාත්කල හැකි බවටත්, ඔවුන් වෛෂයික අවශ්‍යතාවයේ පීඩනය

යටතේ කම්කරු පන්තියේ ක්‍රියාකාරී සහභාගිත්වයකින් තොරව ම සමාජවාදය ක්‍රියාවට නඟනු ඇති බවටත්, නිදසුන් බව එස්ඩබ්ලිව්පීය තර්ක කලේ ය.

127. පැබ්ලෝවාදීන්ගේ තර්කයට බෙහෙවින් සමාන්තරව ගිය එස්ඩබ්ලිව්පීයේ ආස්ථානය, කැනන්ගේ විවෘත ලිපියෙන් ගෙනහැර දැක්වූ මූලධර්ම ප්‍රතික්ෂේප කිරීමකි. ගොවි ජනතාව මත පදනම්වූ සුලු ධනපති ගරිල්ලා නායකයන්ගේ කටයුතු මඟින්, කම්කරු පන්ති පාලනයක අංගෝපංග නොමැති තතු යටතේ වුවත් කම්කරු රාජ්‍යයන් නිර්මානය කල හැකිනම්, හතරවන ජාත්‍යන්තරයේ අර්ථය කුමක්ද? සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය දේශපාලනිකව සංවිධානය කිරීමේ කුමන අවශ්‍යතාවක්ද? ලතින් ඇමරිකාවේ ගරිල්ලා යුදවාදය හා කැස්ට්‍රෝ වාදයට එස්ඩබ්ලිව්පීයේ ස්තෝත්‍ර ගායනය වනාහි ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තිය සඳහා විප්ලවවාදී ඉදිරිදර්ශනයක අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කිරීමකි. කියුබාව පිලිබඳ එහි පිලිවෙත, එක්සත් ජනපදය තුල මධ්‍යම පන්තික විරෝධතා දේශපාලනයට එන්ට එන්ටම පක්ෂයේ අනුගතවීම සමඟ අතිනත ගෙන ගමන් කලේය.

## සෝෂලිස්ට් ලේබර් ලීගය ට්‍රොට්ස්කිවාදය ආරක්ෂා කරයි

128. මෙම වර්ධනයන් ජාත්‍යන්තර කමිටුව තුල දේශපාලන ගැටුම උත්සන්න කලේය. 1961 ජනවාරි 2 දරන ලිපියෙන් හජාජාක බ්‍රිතාන්‍ය ශාඛාව වූ සෝෂලිස්ට් ලේබර් ලීගය (එස්එල්එල්) එස්ඩබ්ලිව්පී නායකත්වයට මෙසේ ලියා යැවීය.

> විප්ලවීය ව්‍යාපාරය හමුවෙහි පවතින දැවැන්ත ම අනතුර නම් එක්කෝ අධිරාජ්‍යවාදයේ ශක්තියට නැතහොත් කම්කරු ව්‍යාපාරය තුල තිබෙන නිලධාරිවාදී තන්ත්‍රයන්හි ශක්තියට එසේත් නැතහොත් ඒ දෙකෙහි ම ශක්තියට යටත් වීමකින් ගලා එන දියකරහැරීම්වාදය යි. ජාත්‍යන්තර මාක්ස්වාදී ව්‍යාපාරය තුල පවතින මෙම දියකරහැරීම්වාදී ප්‍රවනතාව, 1953 හි දී පැබ්ලෝවාදයෙන් නියෝජනය කෙරුනාට ද වඩා පැහැදිලිව අද දින පැබ්ලෝවාදයෙන් නියෝජනය කෙරේ.
>
> කම්කරු පන්තියේ දේශපාලනික ස්වාධීනත්වය පිලිබඳ මූලෝපායත් විප්ලවීය පක්ෂ ගොඩනැංවීමත් කෙරෙන් මොනයම් හෝ පසුබෑමක්, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පැත්තෙන් ගත් කල්හි, බරපතල ලෝක ඓතිහාසික වැරැද්දක් වනු ඇත.
>
> සංශෝධනවාදයේ සියලුම රූපාකාරයන්ට විරුද්ධව බෙදුම්කඩනයන් ඇඳ ගැනීම අපේ හදිසි අවශ්‍යතාව වී ඇත්තේ ට්‍රොට්ස්කිවාදය හමුවෙහි විවෘත වන අවස්ථාවන්හි දැවැන්ත බවත් ඒ නිසා ම දේශපාලනික හා න්‍යායික පැහැදිලි කම සඳහා පවතින අවශ්‍යතාවත් නිසා ය. පැබ්ලෝවාදී සංශෝධනවාදය ට්‍රොට්ස්කිවාදය තුල තිබෙන ප්‍රවනතාවක් ලෙස සැලකුනු කාල පරිච්ඡේදය අවසානයකට පත් කිරීමට කාලය පැමින තිබේ. මෙය නොකල හොත් දැන් ඇරඹෙන විප්ලවීය අරගලවලට සූදානම් වීමට අපට නුපුලුවන සමාජවාදී කම්කරු පක්ෂය මෙම සිතිවිල්ලෙන් අප හා පෙරට යාම අපට අවශ්‍ය ය. [80]

129. 1961 මැයි මාසයේ එස්එල්එල් (බ්‍රිතාන්‍ය ශාඛාව) එස්ඩබ්ලිව්පීය ට්‍රොට්ස්කිවාදයෙන් පලායාම හා යටත් විජිත විරෝධී හා අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයන්හි ආධිපත්‍ය දැරූ නිමක් නැති ධනපති හා සුලු ධනපති ජාතිකවාදී ප්‍රවනතාවන්ට වඩාත් ප්‍රකට ලෙස එහි අනුගතවීම පිලිබඳව සිය විවේචන පුලුල් කලේය. එස්එල්එල් ලියවිලිවලින් තහවුරු කල පරිදි එස්ඩබ්ලිව්පී පිලිවෙත නියෝජනය කලේ ට්‍රොට්ස්කි විසින් සිය නොනවතින විප්ලවයේ න්‍යාය තුල තහවුරු කල සංකල්ප අතහැර දැමීමයි...

> මේ යුගයෙහි විප්ලවීය මාක්ස්වාදයේ අත්‍යවශ්‍ය අංගයක් වනුයේ අඩු දියුනු රටවල ජාතික ධනපති පන්තිය අධිරාජ්‍යවාදය පරදවා ස්වාධීන ජාතික රාජ්‍යයක් පිහිටුවීමට අපොහොසත් වේ ය යන්න යි. මෙම පන්තියට අධිරාජ්‍යවාදය හා බැඳීම් තිබෙන අතර සත්තකින්ම එය ස්වාධීන ධනේශ්වර වර්ධනයක් ඇති කර ගැනීමට අපොහොසත් වෙයි; මන්ද, එය ධනපති ලෝක වෙලඳපොලෙහි කොටසක් ද දියුනු රටවල නිෂ්පාදිතයන් හා තරග කිරීමට අපොහොසත් ද වන වන හෙයිනි.
>
> ගානාව බඳු රටවල් සේන්දුව සිටින 'නිදහස' පිලිබඳ අදියර ද කෙන්යාවේ එම්බෝයා බඳු මිනිසුන් නායකත්වය දුන් ජාතික විමුක්ති ව්‍යාපාර ද අනෙක් රටවල ජාතික විමුක්ති ව්‍යාපාරවල ට උත්තේජකයක් හැටයට ක්‍රියාකාරී වන බව සත්‍යයක් වුවත්, එන්ක්‍රෘමා, එම්බෝයා, නසර්, කසීම්, නේරු, සුකර්නෝ වැන්නන් තමන්ගේ ම රටවල ජාතික ධනේශ්වරය නියෝජනය කරන බව නිෂ්ප්‍රභ කෙරෙන්නේ නැත. ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය යන දෙරටෙහි ම ආධිපත්‍යය උසුලන අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති

සම්පාදකයන් මේ ගනයේ නායකයන්ට දෙශපාලනික 'ස්වාධීනත්වය' භාර දීමෙන් හෝ ෆාරුක් හා නූරිස් - සයිඩ් බඳු වැඩවසම් කොටස්වලට ඉහලින් ඔවුන්ගේ ජයග්‍රහය පිලිගැනීමෙන් හෝ පමනක් ම, ආසියාව අප්‍රිකාව හා ලතින් ඇමරිකාව තුල පරදුවට තැබූ ජාත්‍යන්තර ප්‍රාග්ධනය හා එය පවත්වාගෙන යන මූලෝපායාත්මක සන්ධාන රැක ගත නොහැකි වන බව සපුරා විශ්වාස කරත්...

එබඳු ජාතිකවාදී නායකයන්ගේ කාර්යභාරය ඔසවා තැබීම ට්‍රොට්ස්කිවාදීන්ගේ කර්තව්‍යය නො වේ. මෙම නායකයන්ට මහජන සහයෝගය මෙහෙයවා ගත හැකි වනුයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා විශේෂයෙන්ම ස්ටැලින්වාදය විසින් නායකත්වය පාවා දෙනු ලැබීම නිසා **පමනි**. ඒ අයුරින් ඔව්හු අධිරාජ්‍යවාදයත් කම්කරු-ගොවි මහජනතාවත් අතර බෆර් බවට පත් වෙති. සෝවියට් සංගමයෙන් ආර්ථික ආධාර ලබා ගැනුමට තිබෙන පුලුවන් කම, බොහෝවිට මොවුන්ට අධිරාජ්‍යවාදීන් හා වඩාත් වාසි දායක ගිවිසුම් ඇති කර ගැනුමට ආධාරක වන අතර ම ධනේශ්වරයේ හා සුලු ධනේශ්වරයේ නායකයන් අතර සිටින වඩාත් රැඩිකල් කොටස්වලට අධිරාජ්‍යවාදී අයිතීන්ට පහර ගසා මහජනයාගෙන් තව දුරටත් සහයෝගය ලබා ගැනුමට පවා පුලුවන්කමක් ලබා දෙයි. එහෙත් අපට සෑම අවස්ථාවක දී ම වැදගත් ප්‍රශ්නය වන්නේ මෙම රටවල කම්කරු පන්තිය මාක්ස්වාදී පක්ෂයක් මගින් දේශපාලනික ස්වාධීනත්වය ලබා ගෙන, දුගී ගොවීන් සෝවියට් සභා ගොඩනැංවීමට මෙහෙයවීමත්, ජාත්‍යන්තර සමාජවාදී විප්ලවය හා සමග අවශ්‍ය වන ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනංවා ගැනීම සැලකිල්ලට ගැනීමත් ය. අපේ අදහසේ හැටියට ට්‍රොට්ස්කිවාදීන් කිසිම අවස්ථාවක මෙම කර්තව්‍යය, ජාතිකවාදී නායකත්වය සමාජවාදීන් බවට පත් විය යුතු ය යන අපේක්ෂාව මගින් විස්ථාපනය නොකල යුතු ය. කම්කරු පන්තිය විමුක්ත කර ගැනීම කම්කරුවන්ගේ ම කර්තව්‍යය වෙයි. [81]

130. කියුබාව සම්බන්ධ ප්‍රශ්නය ගැන එස්එල්එල්හි එකතුකිරීම

කියුබාව පිලිබඳ වර්තමාන සාකච්ඡාවෙන් බොහෝ කොටසක් ඉදිරියට යන්නේ, මේ අයුරිනිඃ කියුබානු මහජනතාව කැස්ට්‍රෝට සහයෝගය දක්වයි; කැස්ට්‍රෝ සුලු ධනපතියකු ලෙස වැඩට මුල පිරුවත් සමාජවාදියකු බවට පත්ව සිටී; අධිරාජ්‍යවාදී ප්‍රහාරයේත් මහජන අරගලයේත් ප්‍රකට පීඩනයෙන් ඔහු මාක්ස්වාදියකු බවට පත් වීමට අවකාශ ඇති අතර විප්ලවයෙහි ජයග්‍රහන ආරක්ෂා කිරීමේ දී, තමන් මුහුන දී සිටින කර්තව්‍යයන් විසින් දැනට ම ඔහු ට්‍රොට්ස්කිවාදයෙන් වෙන් කොට හඳුනා ගත නොහැකි ආස්ථානයන් කරා 'ස්වාභාවිකව ම' රැගෙන එනු ලැබ ඇත. හැරත් අප දේශපාලනික ප්‍රවනතා තක්සේරු කල යුතු වන්නේ, පන්ති පදනමක පිහිටමින්, දීර්ඝ කාල පරිච්ඡේද මුලුල්ලේ පන්තීන්හි චලනයට සම්බන්ධිතව අරගල මගින් එම ප්‍රවනතා වර්ධනය වන අයුරිනි. කම්කරු පන්ති විප්ලවය පසෙක තිබියේවා, කිසි ම පසුගාමී රටක කම්කරු පන්ති පක්ෂයක්, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ වැදගත්කම 'ස්වාභාවික'ව හෝ 'අහම්බයෙන්' හෝ වටහා ගන්නා සුලුධනේශ්වර ජාතිකවාදීන්ගේ පරිවර්තනය හේතු කොට ගෙන උද්භවය නොලබනවා ඇත. [82]

## පැබ්ලෝවාදී යලි එකමුතුව හා ලංකාවේ පාවාදීම

131. 1963 ජූනි මාසයේදී එස්ඩබ්ලිව්පී හා යුරෝපීය පැබ්ලෝවාදීන් එක්සත්වීමේ සම්මේලනයක් පවත්වා අලුත් "එක්සත් ලේකම් මන්ඩලයක්" ගොඩනැගුහ. මෙම කොන්ග්‍රසයේ ප්‍රතිගාමී හා මූලධර්ම විරහිත ස්වභාවය හැරෙන්නට, 1953 භේදයට තුඩුදුන් ප්‍රශ්න විභාගකිරීම එකහෙලා ප්‍රතික්ෂේප කිරීම කැපී පෙනෙයි. මතභේද අතීතයට මැකීගොස් ඇතැයි ද, " නව ලෝක යථාර්තය" හමුවේ ඒවා තවදුරටත් අදාල නෙවේයයි ද පුන පුනා කියාපෑම මගින් සිදුවූයේ පැබ්ලෝවාදී දේශපාලනයේ සැබෑම හා අනතුරුදායක ඇඟවුම් වසංකිරීම පමනි. ජීවිතයත් මරනයත් අතර ප්‍රශ්න සාකච්ඡාවෙන් බැහැර කොට තැබුනු, ප්‍රතිගාමී හා ප්‍රෝඩාකාරී "යලි එකමුතුවීමේ" සමුලුවට සහභාගීවීම, බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් විසින් ප්‍රතික්ෂේප කිරීම වනාහි, ශ්‍රේෂ්ඨ දේශපාලන නිර්භීත ක්‍රියාවක් විය.

132. හුදෙක් පරදුවට තැබුනේ කුමක් ද යන්න යාන්තම් වසරක් ගතවෙද්දී එලිමහනට පැමිනියේය. 1964 ජූනි මාසයේ දී පැබ්ලෝවාදී ජාත්‍යන්තරයේ ප්‍රමුඛ ශාඛාවක්වූ ලංකා සමසමාජ පක්ෂය, (ලසසප) ලංකා අගමැති සිරිමා බන්ඩාරනායක මැතිනිය ඇගේ නව සභාග ආන්ඩුවට ඇතුල්වන ලෙස කල ආරාධනය පිලිගත්තේය. ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසය තුල සමාජවාදී මූලධර්ම

එවන් ගොරතර භාවයකින් පාවාදීමට සම්බන්ධ වූ ප්‍රථම අවස්ථාව මෙය විය. මෙම පාවාදීම සමසමාජ පක්ෂයේ වසර ගනනාවක දේශපාලන රූටායාම මඟින් සූදානම් කර තිබුනේවී නමුත්, ලසසපයේ දේශපාලන පරිහානිය පිලිබඳ සාකච්ඡාව පැබ්ලෝවාදීන් විසින් අවහිර කර තිබුනි. යලි එකමුතුවීමෙන් යන්තම් වසරක් ගෙවුනු තැන, එස්ඩබ්ලිව්පීයේ තීරනාත්මක සහයෝගය ඇතිව පැබ්ලෝවාදී ජාත්‍යන්තරය, ලක්ෂයකගේ පමන ජීවිත බිලිගත්, ශ්‍රී ලංකා සමාජය විනාශයට පත්කල, සිවිල් යුද්ධයකට මඟ හෙලිකල දේශපාලන ක්‍රියාවලියක් දියත්කල, පාවාදීමකට වින්නඹුකම කලේය. ලාංකික ව්‍යසනය තුල පැබ්ලෝවාදීන් ඉටුකල ක්‍රියාකලාපය පිලිබඳ ජාත්‍යන්තර කමිටුවේ හෙලාදැකීම, කාලයේ පරීක්ෂනයට බඳුන්වී තිබේ. "බන්ඩාරනායක සභාගයට ලංකා සමසමාජ පක්ෂ සාමාජිකයන්ගේ ඇතුල්වීම හතරවන ජාත්‍යන්තරයේ පරිනාමයෙහි මුලුමහත් යුගයක ම අවසානය සනිටුහන් කරයි. කම්කරු පන්තියේ පරාජය සූදානම් කිරීමේ දී, අධිරාජ්‍යවාදයට ඍජු ලෙස සේවය කරනු ලැබුවේ ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල සිය ප්‍රකාශනය අත් කර ගත් එම සංශෝධනයයි." [83]

## මතු සම්බන්ධයි

## සටහන්

[69] *Note book of an Agitator,* ජේම්ස් පී. කැනන්, උද්ඝෝෂකයකුගේ සටහන් පොත (නිව් යෝර්ක්, පයනියර් පබ්ලිෂර්ස්, 1958) පි. 186.

[70] .ඩේවිඩ් නෝර්ත්, *අප රක්නා උරුමය I කොටස*, කම්කරු මාවත ප්‍රකාශන, පි.216-17.

[71].එම, පි. 248.

[72] .*අප රක්නා උරුමය, I කොටස*, කම්කරු මාවත ප්‍රකාශන, පි.257.

[73] .එම, පිටු 251-55.

[74].ඩේවිඩ් නෝර්ත්, *අප රක්නා උරුමය දෙවන කොටස*, කම්කරු මාවත ප්‍රකාශන, 277-278 පිටු.

[75] .එම, 317-18. පි.

[76] .එම, 319 පි.

[77].එම. 330 පි.

[78] .එම, 331.

[79] .එම, 342-44 පි. 1954 මාර්තු 1 දින ජෝර්ජ් බ්‍රිට්මන් වෙත කැනන් යැවූ ලිපිය.

[80] .එම, 525-526 පි. සෝෂලිස්ට් ලේබර් ලීගයේ ජාතික කමිටුවෙන් සමාජවාදී කම්කරු පක්ෂයේ ජාතික කමිටුව වෙත 1961 ජනවාරි 2, යැවූ ලිපියෙනි.

[81].එම, 527-29 පිටු.

[82] .එම, 529-30 පිටු.

[83] .එම, 564 පි.

© www.wsws.org